සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

29 S I

පළමු වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**First Term Test - Grade 12 - 2019**

විභාග අංකය ............................ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I කාලය පැය දෙකයි

**අංක 1 සිට 50 දක්වා එක් එක් ප්‍රශ්නයට 1, 2, 3, 4, 5 යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරා නියමිත අංකයේ කතිරයක් (x) යොදන්න.**

01. මුල් කාලීන ප්‍රාථමික සමාජවල ජීවත් වූ මිනිසා අදහස් හුවමාරු කර ගත්තේ,
    1. කථන භාෂාව භාවිතයෙනි.
    2. භාෂාව සහ ලිපිලේඛන භාවිතයෙනි.
    3. සංඥා, ශබ්ද, සංකේත භාවිතයෙනි.
    4. අණ බෙරය සහ ගින්දර භාවිතයෙනි.
    5. පුවත්පත් සහ ගුවන් විදුලිය භාවිතයෙනි.

02. සන්නිවේදන අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණ තේරුම් ගැනීමට අවශ්‍යවන සාධක වන්නේ,

    A - මිනිසා නිරන්තරයෙන් ලබන අත්දැකීම්

    B - ඔහු එකතු කර ගන්නා තොරතුරු ක්‍රියාවට නැංවෙන ආකාරය

    C - මිනිසා හුවමාරු කර ගන්නා තොරතුරුවල කේන්ද්‍රීය සාධකය සන්නිවේදනය වීම

    D - සන්නිවේදනය ක්‍රියාත්මකවන ආකාරය පිළිබඳව හැදෑරීම

    E - ජන සන්නිවේදන මාධ්‍යවලට විවිධ සීමාවන් පැනවීම

    1. A B D  2. B C D  3. A C D E  4. A B C D  5. A B C D E සියල්ලම

03. වර්තමානයේ අතිවිශාල ලෙස ප්‍රමාණාත්මකව පැතිරී යන මාධ්‍ය තාක්‍ෂණික තොරතුරු ගලනය තුළින් සිදුවන අයහපත් බලපෑමෙන් මිනිසා ගලවා ගැනීමට සිදු කළ යුත්තේ,
    1. මාධ්‍ය භාවිතයෙන් පුද්ගලයා ක්‍රමයෙන් ඉවත් කිරීමට කටයුතු යෙදීමයි.
    2. නව මාධ්‍ය, සමාජ ජාල සීමා කිරීමට නීති සකස් කිරීමයි.
    3. මාධ්‍ය පරිහරණයට අවශ්‍ය නිසි දැනුමෙන් පුද්ගලයා සන්නද්ධ කිරීමයි.
    4. මාධ්‍ය ආකෘති සැකසීම පිළිබඳව ලෝක මතයක් ඇති කිරීමයි.
    5. විද්‍යුත් මාධ්‍යයේ ගුණාත්මකත්වය පිරික්සීමේ නියාමනයක් ඇති කිරීමයි.

04. නාලිකාවකින් සිදුවන්නේ,
    1. සන්නිවේදකයා තුළ බලපෑමක් සිදු කිරීමයි.
    2. අපේක්ෂිත පාර්ශවය කරා පණිවිඩය ගෙන යාමයි.
    3. ග්‍රාහකයා වෙත තොරතුරු සම්ප්‍රේෂණය කිරීමයි.
    4. සිදුවීම් ආශ්‍රය කරගෙන පණිවිඩයක් සකස් කිරීමයි.
    5. පණිවිඩය ග්‍රාහක ගතවීම වැළැක්වීමට විවිධ බාධක නිර්මාණය කිරීමයි.

05. හැරල්ඩ් ඩී. ලැස්වෙල්ගේ සන්නිවේදන නිර්වචනයෙන් බැහැර වන්නේ,

1. පණිවිඩයයි 2. සන්නිවේදකයායි 3. බලපෑමයි

4. අග්‍රස්ථානයයි 5. නාලිකාවයි

06. 1982 යුනෙස්කෝ ගෲන්වල්ට් ප්‍රකාශනයේ අන්තර්ගතවන මාධ්‍ය අධ්‍යාපන වැඩසටහන් සම්බන්ධ නිර්දේශයන් තෝරන්න.

A පෙර පාසල් අධ්‍යාපනය තුළද මාධ්‍ය අධ්‍යාපන වැඩ සටහන් ආරම්භ කළ යුතු බව.

B පාසල් අධ්‍යාපනය තුළත් විශ්ව විද්‍යාල මට්ටම දක්වාත් මාධ්‍ය අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු බව.

C වැඩිහිටි අධ්‍යාපනය තුළ ද මාධ්‍ය අධ්‍යාපන වැඩසටහන් ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට සහාය දිය යුතු බව.

D මාධ්‍ය අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වගකීම රාජ්‍ය අංශය විසින් පමණක්ම දැරිය යුතු බව.

E මාධ්‍ය අධ්‍යාපන වැඩ සටහන්වලින් ලබාගන්නා විචාරශීලිත්වයේ අවසාන ප්‍රතිඵලය විය යුත්තේ මාධ්‍ය පාලනය සඳහා ක්‍රියාත්මක වීම බව.

1. A B C 2. A B D 3. A B E 4. A B C E 5. A B C D E

07. මාධ්‍ය සාක්ෂරතාව යනු,

1. මාධ්‍ය නැරඹීමේ, කියවීමේ, ඇහුම්කන්දීමේ හැකියාවකි.
2. මාධ්‍ය පරිහරණය, විචාරය, ඇගයීම සහ නිර්මාණය කිරීමේ හැකියාවයි.
3. සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය ප්‍රායෝගික හා න්‍යායාත්මක අන්තර්ගතයන් සමග හැදෑරීමයි.
4. ජනමාධ්‍ය පිළිබඳව පාසල් අධ්‍යාපනය, විශ්ව විද්‍යාල යනාදී ක්ෂේත්‍රවල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කිරීමයි.
5. සන්නිවේදනය ඉගෙනීම, හැදෑරීම සහ ප්‍රගුණ කිරීමේ යෙදී සිටීමයි.

08. ශ්‍රී ලංකාවට සන්නිවේදන විෂය හඳුන්වාදීම සම්බන්ධ **නොගැළපෙන** වාක්‍ය වන්නේ,

1. ''පුවත්පත් කලාවේදය'' පාඨමාලාව සඳහා විෂය නිර්දේශය සකස් කිරීම.
2. ප්‍රථමවරට විධිමත් ලෙස සන්නිවේදන ක්ෂේත්‍රයේ පාඨමාලාවක් ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මූලිකවී සකස් කිරීම.
3. 1971 කැරැල්ලෙන් පසු සන්නිවේදන විෂය වෘත්තීය අභිමුඛ පාඨමාලාවක් ලෙස හඳුන්වා දීම.
4. විශ්ව විද්‍යාලී ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් සිංහල දෙමළ මහාචාර්යවරුන්ගෙන් සමන්විත විද්වත් කමිටුවක් පත් කිරීම.
5. කැළණිය විශ්ව විද්‍යාලයේ 1973 දී ''ජන සන්නිවේදන අධ්‍යයන අංශය ආරම්භ කිරීම.

09. ප්‍රතිපෝෂණය සම්බන්ධ **නිරවද්‍ය** ප්‍රකාශය වන්නේ,

1. සන්නිවේදකයා සන්දේශය හුවමාරු කරගන්නා ක්‍රියාවලියයි.
2. සන්නිවේදකයා වෙත ග්‍රාහකයා ලබාදෙන ප්‍රතිචාරයයි.
3. සන්නිවේදකයාගේ සිට ග්‍රාහකයා වෙත පණිවිඩය ගෙන යන ආකාරයයි.
4. සන්නිවේදන ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට යොදා ගන්නා අත්දැකීම් සමූහයයි.
5. සන්නිවේදනයේදී සිදුවන බාධක අවම කිරීමේ ක්‍රියාවලියයි.

10. ''ලැස්වෙල්ගේ'' සන්නිවේදන නිර්වචනයට අනුව සන්නිවේදන ක්‍රියාවලියේ සිව්වන අවස්ථාවේ සිටින්නේ,

1. ග්‍රාහකයායි 2. මාධ්‍යයයි 3. විකේතිකාරකයායි

4. සන්නිවේදකයායි 5. බාධකයි

11. මත් ද්‍රව්‍ය භාවිතයේ ආදීනව දැක්වෙන දේශනයට සවන්දුන්, සිසුවෙකු තමා ඇබ්බැහි වී සිටින දුම්පානයෙන් ඉවත්වීමට අදිටන් කර ගන්තේය. මෙම පණිවිඩයේ බලපෑම වන්නේ,

1. ආදීනව වටහා ගැනීමයි.
2. වැරදි පුරුදුවලින් ඉවත්වීමයි.
3. දේශනයට සවන් දීමයි.
4. වෙනසක් සිදුනොවීමයි.
5. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවී දුම්පානයෙන් ඉවත්වීමයි.

12. රූපවාහිනී නාලිකාවක් නිරන්තරයෙන්ම ප්‍රකාශ කළේ තම නාලිකාව, නරඹන්නන්ට මුදල් ලැබෙන බවයි. මෙම පණිවිඩයේ සන්නිවේදන අරමුණ වූයේ,

1. බලපෑමක් සිදු කිරීමයි.
2. සන්නිවේදනයක් සිදු කිරීමයි.
3. අධ්‍යාපනයක් ලබාදීමයි.
4. විනෝදාස්වාදයක් ලබාදීමයි.
5. පෙළඹවීමක් ඇති කිරීමයි.

13. 1.පොදු තත්ත්වයට පත් කිරීම, 2.හුවමාරු කර ගැනීම, 3.රහස්‍යභාවයෙන් තොරවීම, 4. සම්ප්‍රේෂණය යන අදහස් ''අර්ථ විග්‍රහයට'' අනුව පෙළ ගැසෙන අනුපිළිවෙල වන්නේ,

1. සංඥා, ප්‍රතිපෝෂණය, තොරතුරු, සන්නිවේදනය
2. පෙළඹවීම, තොරතුරු, බලපෑම, විඥාපනය
3. අදහස්, තොරතුරු, අවබෝධය, හුවමාරුකර ගැනීම
4. තොරතුරු, බලපෑම, අවබෝධය, සන්නිවේදනය
5. අත්දැකීම්, අදහස්, ආකල්ප, තොරතුරු

14. පහත සඳහන් අවස්ථා අතරින් උපදෙස් සම්පාදනයට අදාල අවස්ථා වන්නේ,

A. සම්මුඛ පරීක්ෂණයේදී හැසිරිය යුතු ආකාරය තම දියණියට පියා විසින් පැහැදිලි කිරීම.
B. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන ස්ථානයට යන ගමන් මඟ පැහැදිලි කිරීම.
C. සම්මුඛ පරීක්ෂණයට ගෙන යා යුතු ලිපි ලේඛන පිළිබඳ දැනුවත් කිරීම.
D. සම්මුඛ පරීක්ෂක මණ්ඩලය සම්බන්ධ සුදුසුකම් ප්‍රකාශ කිරීම.
E. සම්මුඛ පරීක්ෂණයෙන් පසු ගෙන ගිය සියළු සහතික අමතක නොකර ගෙන ආයුතු බවට දැනුවත් කිරීම.

1. A B C
2. A C D
3. B D E
4. A D E
5. A C E

15. 1968, 1969 ''පුවත්පත් කලාවේදය'' පාඨමාලාව හඳුන්වා දෙන කාලයේ අධ්‍යාපන ඇමතිධූරය දැරුවේ,

1. රිචඩ් පතිරණ මහතා
2. බද්වුද්ධීන් මහමුත් මහතා
3. ලයනල් ජයතිලක මහතා
4. අයි.එම්.ආර්. ඊරියගොල්ල මහතා
5. අනුර බණ්ඩාරනායක මහතා

16. ඉහත සඳහන් ''පුවත්පත් කලාවේදය'' පාඨමාලාවේ විෂය නිර්දේශය සකස් කරනු ලැබුවේ,

1. මහාචාර්ය විමල් දිසානායක විසිනි.
2. මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර විසිනි.
3. මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර විසිනි.
4. ඩී.පී. රණතුංග මහතා විසිනි.
5. ආචාර්ය එඩ්වින් ආරියදාස විසිනි.

17. ප්‍රාථමික සමාජයේ සිට සන්නිවේදන විකාශනයේ ආරම්භය සහ වර්තමානය සනිටුහන් කරන්නේ,
   1. ශබ්ද, සංඥා, සංකේත සහ අංකිත තාක්ෂණික මාධ්‍ය මෙවලම්ය.
   2. භාෂාව, අක්ෂර මාලාව සහ නූතන මාධ්‍ය විසින්ය.
   3. අවාචික, දෘශ්‍ය මාධ්‍ය සහ රූපවාහිනී මාධ්‍ය විසින්ය.
   4. ගින්දර, අණබෙරය, ලේඛනය සහ නව මාධ්‍ය මෙවලම් විසින්ය.
   5. කථනය, ශ්‍රවණය, දෘශ්‍ය මාධ්‍ය සහ විද්‍යුත් නූතන මාධ්‍ය මඟින්ය.

18. ශ්‍රී ලංකාවේ පෞද්ගලික ගුවන්විදුලි නාලිකාවල නිවේදක නිවේදිකාවන් දෛනිකව භාවිතා කරන්නේ හරයක් නොමැති ඒකාකාරී වචන මාලාවකි. ඊට හේතුවක් **නොවන්නේ**,
   1. අවස්ථාචෝචිත භාෂා භාවිතය පිළිබඳ නිපුණතාවයක් නොමැතිවීමයි.
   2. පුද්ගලයා හා සමාජ සම්බන්ධතා පිළිබඳ අවබෝධයක් නොමැතිකමයි.
   3. සාරධර්ම සහ සමාජ සංස්කෘතිය පිළිබඳ ඇගයීමක් නොමැතිකමයි.
   4. අත්දැකීමෙන් පරිපූර්ණ ප්‍රවීණ මාධ්‍යවේදියෙකුවීම සහ මාධ්‍ය ආචාර ධර්ම සුරැකීමට යොමුවීමයි.
   5. විචාරාත්මක ගුවන් විදුලි නාලිකාවන්ට සවන් දී අත්දැකීම් ලබා නොගැනීමයි.

19. පුද්ගලයාගේ සමාජ ජීවිතයේ වැදගත්ම කේන්ද්‍රීය සාධකය ''සන්නිවේදනය'' ලෙස මුලින්ම හඳුන්වා දුන්නේ,
   1. චාර්ල්ස් කුලි, හැරල්ඩ් ඩී ලැස්වෙල්, ක්ලොඩ් ෂැනොන්
   2. විල්බර් ශ්‍රාම්, වෝල්ටර් ලිප්මාන්, කර්ට් ලෙවින්
   3. වොරන් විවර්, විල්බර් ශ්‍රාම්, හැරල්ඩ් ඩී ලැස්වෙල්
   4. ජෝර්ජ් ගාබ්නර්, පෝල් ලැසාස්ෆෙල්ඩ්, කාර්ල් හවුලන්ඩ්
   5. චාර්ල්ස් කුලි, වෝල්ටර් ලිප්මාන්, ජෝන් ඩුවී

20. සන්නිවේදනය ශාස්ත්‍රීය විෂයක් ලෙස ඉගැන්වීම ආරම්භ කළ පළමු විශ්ව විද්‍යාලය වූයේ,
   1. එංගලන්තයේ ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය යි.
   2. ඉන්දියාවේ පුනා විශ්ව විද්‍යාලය යි.
   3. ඇමරිකාවේ ඉලිනොයිස් විශ්ව විද්‍යාලය යි.
   4. ශ්‍රී ලංකාවේ කැළණිය විශ්ව විද්‍යාලය යි.
   5. පිලිපීනයේ රාජ්‍ය විශ්ව විද්‍යාලය යි.

21. පහත සඳහන් අවස්ථා අතරින් සන්නිවේදන විකාශනය නිවැරදි පිළිවෙලට පෙළගස්වා ඇති පිළිතුර තෝරන්න.
   A. කතා කිරීම සහ ලිවීම සිදු කිරීම.
   B. ගින්දර, දුම, අණබෙරය සන්නිවේදනය සඳහා යොදා ගැනීම.
   C. සංඥා, සංකේත, ඉඟි සහ කට හඬ සන්නිවේදනය සඳහා යොදා ගැනීම.
   D. මුලින්ම භාෂාවත්, ඊළඟට හෝඩියත් අනතුරුව අකුරු නිර්මාණයන් සිදු කිරීම.
   E. පුවත්පතේ, දුරකථනයත් පසුව ගුවන් විදුලියත් ආරම්භ වීම.

   1. A B C D E   2. C B D A E   3. E B A D C   4. B D C A E   5. C D B A E

22. ''සන්නිවේදනය'' යන්නට නොගැලපෙන වාක්‍ය තෝරන්න.
   1. මිනිසා සමාජ කණ්ඩායම් සමඟ සබඳතා දක්වන ආකාරයයි.
   2. තොරතුරු හුවමාරුව සන්නිවේදනයයි.
   3. පුද්ගලයා හා සමාජ සම්බන්ධතාවයන්ගේ පදනම සන්නිවේදනයයි.
   4. සන්නිවේදනය ආරම්භ වන්නේ භාෂාව සකස් කර ගැනීමත් සමඟය.
   5. සන්නිවේදනය තුළින් ගැටලු නිර්මාණයවීමත්, විසඳා ගැනීමත් සිදුවේ.

23. මාධ්‍යයෙන් දෙන සන්දේශ යථාර්ථවාදී ලෙස අවබෝධ කර ගැනීමේ හැකියාව ග්‍රාහකයාට ලැබෙන්නේ,

1. සමාජ පරමාර්ථ තුළිනි.
2. මාධ්‍ය විචාර තුළිනි.
3. ජන මාධ්‍යයට ග්‍රාහකයා බෙහෙවින් නැඹුරුවීම තුළිනි.
4. මාධ්‍ය සාක්ෂරතාව තුළිනි.
5. මාධ්‍ය අනුග්‍රහය තුළිනි.

- **24 සිට 27 දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් වගන්තිය ආශ්‍රයෙන් පිළිතුරු තෝරන්න.**
- මාධ්‍ය ඒකකයේ මාසික රැස්වීම ආරම්භයේදී සභාව පන්සිල්හි පිහිටුවනු ලැබුවේ. ලේකම් මහතා විසිනි.

24. මෙහි සන්නිවේදකයා වූයේ,

1. ලේකම් මහතා
2. පන්සිල්
3. මාධ්‍ය ඒකකයේ සිසුන්
4. මාධ්‍ය ඒකකය භාර ආචාර්යවරයා
5. විදුහල්පතිතුමා

25. සන්නිවේදකයා ලබාදුන් පණිවිඩය වූයේ,

1. මාධ්‍ය ඒකකයේ මාසික රැස්වීමේ න්‍යාය පත්‍රයයි.
2. වාර්තාව කියවීමයි.
3. පන්සිල් දීමයි.
4. යෝජනා ඉදිරිපත් කිරීමයි.
5. අනුශාසනා කථාවයි.

26. මෙහි සිටි ග්‍රාහකයා වූයේ,

1. සභාපති ඇතුළු නිලධාරී මණ්ඩලයයි.
2. මාධ්‍ය ඒකකයේ ඇඳුරු මඬුල්ලයි.
3. රැස්වී සිටි සභාවයි.
4. ග්‍රාහකයෙකු අඳුනාගත නොහැක.
5. අනුශාසක මඬුල්ලයි.

27. වාර්තාව ඉදිරිපත් කරද්දී විදුලිය ඇණ හිටීම නිසා ශබ්ද විකාශන යන්ත්‍ර ක්‍රියා විරහිත වූයේ නම් එහි ඇති වූයේ,

1. මාධ්‍ය බාධකයකි
2. අර්ධ බාධකයකි
3. බලපෑමකි
4. ප්‍රතිපෝෂණයකි
5. වැඩසටහන අසාර්ථක වීමකි.

28. පුද්ගලයෙක් සන්නිවේදන අවස්ථාවලදී තොරතුරු හුවමාරුව සඳහා භාවිතා කරන්නේ,

1. නව මාධ්‍යයයි
2. නූතන මාධ්‍යයයි
3. පංචේන්ද්‍රයයි
4. ජංගම දුරකථනයයි
5. මානව බුද්ධියයි

29. සන්නිවේදනය සඳහා සංඥා, සංකේත යොදාගැනීම බහුලවම සිදුවෙයි. මූලිංක සංඥා ක්‍රමවන A ස්වභාවික සංඥා B මුද්‍රා සංඥා C සන්නිවේදන සංඥා යන සංඥා ක්‍රමවලට පහත සඳහන් අවස්ථාවන් නිවැරදිව පෙළ ගැස්වූ විට ගැළපෙන පිළිතුර තෝරන්න.

1. පොදු ස්ථානවල දේශපාලකයින්ගේ ඡායාරූප සහිත පෝස්ටර් ප්‍රදර්ශනය කර තිබීම.
2. කළු පැහැති සණ වැහි වළාකුළු අහසෙහි දෘශ්‍යමානවීම.
3. මල් සුවඳ දැනෙන දිශාවට මී මැස්සන් පියඹා යාම.
4. කෘමිනාශක බෝතල්වල කතිරයක් අදින ලද හිස් කබලක ඡායාරූපයක් තිබීම.
5. පොලිස් නිලධාරීන් නිල ලාංඡන පැළඳ සිටීම.

1. A B C C B 2. B A A C B 3. C A C B B 4. C C A B C 5. A A C B C

30. සන්නිවේදනය ''සන්දර්භානුගතවීම'' යන්නෙන් අදහස් වන්නේ,
   1. සන්නිවේදනයේ ඇති විවිධත්වයයි.
   2. අදාල සන්නිවේදනය සිදුවන වටපිටාවයි.
   3. පුද්ගලයා සහ සමාජය අතර සම්බන්ධතාවයයි.
   4. සන්නිවේදනය සඳහා තාක්‍ෂණය භාවිතා කිරීමයි.
   5. සන්නිවේදනය ගතිකවීම නිසා ඇතිවන ප්‍රතිඵලයයි.

31. භූගෝලීය සිතියමක් නිරීක්‍ෂණය කරන ඔබ ලබා ගන්නේ,
   1. තොරතුරුය.   2. උපදෙස්ය.   3. සමාජානුයෝජනය වීමය.
   4. අත්දැකීම්ය.   5. බලපෑමක්ය.

32. තොරතුරු ගබඩා කර, කල්තබා ගැනීමට පදනම වැටුණේ,
   1. භාෂාව සකස්කර ගැනීමත් සමඟය.   2. පුවත්පත නිර්මාණයවීමත් සමඟය.
   3. මුද්‍රණ යන්ත්‍රය සොයා ගැනීමත් සමඟය.   4. ලේඛනය ආරම්භවීමත් සමඟය.
   5. අන්තර්ජාලය පැමිණීමත් සමඟය.

33. දෙමළ භාෂාවෙන් ''සන්නිවේදනය'' යන්න ''තොඩර්පාඩල්'' යනුවෙන් හඳුන්වයි. එහි සිංහල අදහස වන්නේ,
   1. දැනගත් දේ දැන ගැනීමට සැලැස්වීම යන්නයි.   2. අදහස් සංකල්ප පිළිබඳ දැනුම යන්නයි.
   3. සබඳතා පැවැත්වීමේ ක්‍රියාවලිය යන්නයි.   4. මැනවින් දැනුම්දීම යන්නයි.
   5. පොදු බවට පත්කිරීම යන්නයි.

34. තොරතුරු විශාල ප්‍රමාණයක් මිනිසුන් රාශියකට එකවර කඩිනමින් බෙදාහැරීමේ හැකියාව ලැබුනේ,
   1. ජනමාධ්‍යවල ආගමනයෙන් පසුවය.   2. දුරකථනය සොයා ගැනීමෙන් පසුවය.
   3. ශබ්ද විකාශන පද්ධති නිර්මාණය කිරීමෙන් පසුවය.   4. චන්ද්‍රිකා තාක්‍ෂණය ආරම්භවීමෙන් පසුවය.
   5. නව මාධ්‍ය ආගමනයෙන් පසුවයි.

35. දුම්රිය හරස් මාර්ගය හරහා මෝටර් රථය ධාවනය කිරීමට උත්සාහ කරත්ම ඇතින් ඇසුණු දුම්රියේ හූ හඬ නිසා රියදුරු මහතා මෝටර් රථය පසු පස්සට ගත්තේය. මෙම අවස්ථාවට නොගැලපෙන වර්ණය තෝරන්න.
   1. අවාචික සන්නිවේදනයක් සිදුවිය.
   2. අන්තර් පුද්ගල සන්නිවේදනයක් සිදුවිය.
   3. ඒක මාර්ගික සන්නිවේදනයක් සිදුවිය.
   4. අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයක් සිදුවිය.
   5. ශ්‍රව්‍ය සන්නිවේදනයක් සිදුවිය.

36. සන්දේශයක අන්තර්ගත වන සංඥා, සංකේත අර්ථකථනය කර ග්‍රහණය කර ගැනීමේ ක්‍රියාවලිය,
   1. සන්නිවේදනයයි.   2. ආකේතකරණයයි.   3. මාධ්‍ය සංස්කෘතියයි.
   4. විකේතිකරණයයි.   5. ප්‍රතිපෝෂණයයි.

37. සන්නිවේදනය පිළිබඳ ෂැනන් - වීවර් නිර්වචනයේ ''වෙනත් තැනකදී ප්‍රති නිර්මාණය කිරීම'' යන්නෙන් අදහස් කරන්නේ,
   1. සන්නිවේදකයා පණිවිඩය දුන් බවයි.   2. පණිවිඩයක් සකස්කළ බවයි.
   3. ඈත දුරකට පණිවිඩය ගමන් කළ බවයි.   4. ග්‍රාහකයා පණිවිඩය ලබාගත් බවයි.
   5. ප්‍රතිපෝෂණයක් සිදුවුනු බවයි.

38. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය ''බලය'' උත්පාදනය සඳහා අවශ්‍ය පසුබිම සකසන්නේ,

1. භෞතික සම්පත් වර්ධනය කර ගැනීමෙනි.
2. දේශපාලනය සහ ප්‍රචණ්ඩත්වය පාදක කර ගැනීමෙනි.
3. මහජන සම්බන්ධතා වර්ධනය කර ගැනීමෙනි.
4. මූල්‍ය සම්පත් වර්ධනය කර ගැනීමෙනි.
5. තර්කානුකූල චින්තනය වර්ධනය කිරීමෙනි.

39. සන්නිවේදනය පිළිබඳ ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයේ නිර්වචනයන්ගෙන් පරිබාහිර සංසිද්ධීන් වන්නේ,

1. වාචික, අවාචික, ලිඛිත සන්නිවේදනය මඟින් ප්‍රකාශ කිරීම.
2. අදහස් හෝ දැනුම ප්‍රකාශ කිරීම.
3. භාෂණය, ලේඛනය හෝ සංඥා මඟින් දැනුම හුවමාරු කර ගැනීම.
4. සංකේත, සංඥා අදහස් බවට පත්කර ජනමාධ්‍ය මඟින් බෙදාහැරීම.
5. අදහස්, දැනුම, භාෂණය, ලේඛනය සහ සංඥා මඟින් ප්‍රකාශ කිරීම.

40. පන්තියේ සිසුන් වැඩි දෙනෙකුට පාඩමේ අන්තර්ගතයේ වැඩි ප්‍රමාණයක් වැටහී තිබුනේ නැත. මෙහි අන්තර්ගතය යනු,

1. සන්දේශයයි. 2. සන්නිවේදකයායි. 3. නාලිකාවයි. 4. බලපෑමයි. 5. ග්‍රාහිකයායි

41. පහත දැක්වෙන්නේ මීනා, ශෂිකලා, ෆාතිමා යන යෙහෙළියන්ගේ අදහස් කිහිපයකි.

**ශෂිකලා - විල්බර්ශ්‍රාම් සන්නිවේදනය අඛණ්ඩ ක්‍රියාවලියක් බව පැහැදිලි කර තිබෙනවා.**

**ෆාතිමා - මාධ්‍ය සාක්ෂරතාව සන්නිවේදන මූලිකාංගයක් වෙනවා.**

**මීනා - ලැස්වෙල් නිර්වචනයේ මූලිකාංග 5ක් දැක්වෙනවා.**

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය හෝ ප්‍රකාශ සිදුකර ඇත්තේ,

1. ෆාතිමාය. 2. ශෂිකලාය. 3. මීනාය.
4. ෆාතිමා සහ මීනාය. 5. ශෂිකලා සහ මීනාය.

42. 1960 දශකයේදී වෘත්තීය මාධ්‍යවේදීන් සඳහා පුහුණු පාඨමාලා පවත්වන ලද ආයතන සහිත වරණය වන්නේ,

1. ලංකා ගුවන්විදුලි සේවය, විජය පුවත්පත් ආයතනය
2. ගුණසේන පුවත්පත් ආයතනය, ලේක් හවුස් පුවත්පත් ආයතනය
3. ලංකා ගුවන්විදුලි සේවය, ලේක් හවුස් ආයතනය
4. උපාලි පුවත්පත් ආයතනය, රජයේ ගුවන්විදුලි මධ්‍යස්ථානය
5. ආධුනික ගුවන්විදුලි සංගමය, ජාතික ගුවන්විදුලිය

43. සන්නිවේදනය සඳහා යොදාගන්නා ප්‍රධානතම උපකරණය වන්නේ භාෂාවයි. භාෂාවේ ද්විරූපීතාවය යනු,

1. සන්නිවේදක ග්‍රාහක ස්ථාන හුවමාරුවයි.
2. සන්නිවේදකයා නිසිලෙස ග්‍රාහකයාට පණිවිඩයක් ප්‍රධානය කිරීමයි.
3. මාධ්‍ය තුළ සිංහල භාෂාව සමඟ ඉංග්‍රීසි වචන මිශ්‍රකර නිවේදන කටයුතු සිදුකිරීමයි.
4. නව මාධ්‍යතුල ඉංග්‍රීසි අක්ෂරවලින් සිංහල / දෙමළ වාක්‍ය ලිවීමයි.
5. භාෂාවක කථන භාෂාවක් සහ ලිඛිත භාෂාවක් භාවිත වීමයි.

44. සන්නිවේදනය ද්විමාර්ගික වූ අවස්ථාවක් වන්නේ,

1. ධර්ම දේශනයකට සවන්දීම. 2. පාඩම් කිරීම. 3. සාකච්ඡාවක් පැවැත්වීම.
4. චිත්‍රයක් ඇඳීම. 5. පුවත්පතක් කියවීම.

45. සන්නිවේදන ක්‍රියාවලියක් අංග සම්පූර්ණ වීමට,

1. නව මාධ්‍ය පිළිබඳ සාමාන්‍ය දැනුමක් අවශ්‍ය වේ.
2. ජන මාධ්‍ය පරිහරණය පිළිබඳ සාක්ෂරතාව අවශ්‍ය වේ.
3. ග්‍රාහක ප්‍රතිපෝෂණය අත්‍යවශ්‍ය වේ.
4. සංවාද, මතවාද, අදහස් ගැටුම්වලින් තොරව ඉදිරිපත් විය යුතුවේ.
5. මාධ්‍ය නියාමනය නිරන්තරයෙන් සිදුවිය යුතුවේ.

46. අංකිත තාක්‍ෂණය හරහා සිදුකෙරන මාධ්‍ය කාණ්ඩය වන්නේ,

1. ජංගම දුරකථනය, පරිගණකය, ගුවන් විදුලිය.
2. රූපවාහිනිය, කෙටි පණිවිඩ, වෙබ් රේඩියෝ.
3. අන්තර්ජාල පුවත්පත්, වෙබ් අඩවි, ගුවන් විදුලිය.
4. සමාජ ජාල, කෙටි පණිවිඩ, විද්‍යුත් තැපැල.
5. සිනමාව, රූපවාහිනිය, සමාජ ජාල.

47. ජන මාධ්‍යයෙන් ප්‍රචාරයවන වෙළෙඳ දැන්වීම්,

1. අධ්‍යාපනය ලබාදීම සඳහා ප්‍රචාරය කරයි.
2. තොරතුරු ලබාදීම සඳහා ප්‍රචාරය කරයි.
3. වෙළෙඳපොළට පැමිණි නව භාණ්ඩ හඳුන්වාදීම සඳහා ප්‍රචාරය කරයි.
4. විනෝදාස්වාදය ලබාදීම සඳහා ප්‍රචාරය කරයි.
5. ග්‍රාහකයා පොළඹවා ගැනීම සඳහා ප්‍රචාරය කරයි.

48. ''මානව සම්බන්ධතා රඳවා සිටින්නාවුත් වර්ධනය කරන්නාවුත්, සියලු සංකේත මෙන්ම ඒවා දේශයෙන් දේශයට ප්‍රවාහනය කිරීමටත්, කාලයේ බැදුම්වලින් ඔබ්බට ගොස් සුරක්ෂිත කර ගැනීමටත් උපකාරීවන උපක්‍රම සන්නිවේදනයයි.'' මෙම නිර්වචන ඉදිරිපත් කළේ,

1. විමල් දිසානායක විසිනි.
2. ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂය විසිනි
3. හැරල්ඩ් ඩී ලැස්වෙල් විසිනි.
4. චාල්ස් එච්. කුලි විසිනි.
5. ෂැනන් සහ විවර් විසිනි.

49. තොරතුරු සම්පාදන කාර්ය ගුණාත්මක බවින් ඉහළ අගයක් ගන්නේ,

A නිරවද්‍යතාව මත.
B විශ්වාසනීයත්වයෙන් යුතුවීම මත.
C පහසුවෙන් තේරුම්ගත හැකිවීම මත.
D අධ්‍යාපනය යසඳහා වැදගත්වීම මත.
E වාණිජ මුහුණුවරක් ගැනීම මත.

1. A B නිවැරදිය.
2. B C නිවැරදිය.
3. C D නිවැරදිය.
4. D E නිවැරදිය.
5. A E නිවැරදිය.

50. ග්‍රාහකයෙකු සම්බන්ධ නිදොස් ප්‍රකාශය වන්නේ,

1. නිරන්තරයෙන්ම ග්‍රාහකයා බුද්ධිමත්ය.
2. ග්‍රාහක භූමිකාව ස්ථාවරව පවතියි.
3. ග්‍රාහකයා සෑම විටම උසස් සාක්ෂරතාවයකින් යුක්තව පවතී.
4. ග්‍රාහකයාගේ සාක්ෂරතා මට්ටම සම මට්ටමින් පවතී.
5. දෙදෙනෙකු නොමැති තැන ග්‍රාහකයෙකු දැකිය නොහැකිය.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| 29 | S | II |
|---|---|---|

පළමු වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**First Term Test - Grade 12 - 2019**

විභාග අංකය ............................ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II කාලය පැය තුනයි

- **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. (i) සන්නිවේදනය විෂය, සන්නිවේදන අධ්‍යයනය (Communication - Studies) නමින් ස්වාධීන විෂයක්වීමට පෙර කුමන විෂය සංකලනයකින් සමන්විත වීද ?
    (ii) සමාජය තුළ සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රය ස්වාධීන විෂයක් ලෙස ගැඹුරෙන් අධ්‍යයනය කිරීමට පෙළඹවූ ප්‍රධාන කරුණු 3ක් දක්වා එයින් එකක් පැහැදිලි කරන්න.
    (iii) රූපවාහිනී මාධ්‍ය සම්බන්ධයෙන් මහාචාර්ය විල්බර්ශ්‍රාම් ඔහුගේ ප්‍රථම පර්යේෂණ වාර්තාවේ ඉදිරිපත් කළ කරුණු 3ක් විස්තර කරන්න.
    (iv) සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය යන විෂය කොටස් දෙක කරුණු 2ක බැගින් යොදා ගනිමින් විස්තර කරන්න.

02. (i) විල්බර්ශ්‍රාම්ගේ සන්නිවේදනය පිළිබඳ නිර්වචනය ලියන්න.
    (ii) සන්නිවේදනය ''සන්දර්භානුගතය'' යන්න හැර සන්නිවේදනයේ වෙනත් ස්වභාවයන්, දෙකක් දක්වා පැහැදිලි කරන්න.
    (iii) ''මාධ්‍ය අධ්‍යාපනය'' යන්න පිළිබඳව කරුණු 3ක් ආශ්‍රයෙන් කෙටි පැහැදිලි කිරීමක් කරන්න.
    (iv) රූපවාහිනිය මඟින් ප්‍රචාරය වන ටෙලි නාට්‍ය තුළින් ඉටු කෙරෙන සන්නිවේදන කාර්යයන් 4ක් නම් කර, විස්තර කරන්න.

03. (i) පුද්ගලයෙකු සන්නිවේදනයේ යෙදෙන්නේ ''කිසියම් අරමුණක් ඉටුකර ගැනීම සඳහාය'' පැහැදිලි කරන්න.
    (ii) ''සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය'' විෂය හැදෑරීමේ අවශ්‍යතාවය කරුණු 6කින් දක්වන්න.
    (iii) සන්නිවේදන බාධක ලෙස දැක්වෙන්නේ කවර තත්ත්වයක්ද හඳුන්වන්න. බාධක නම් කරන්න. බාධක කෙටියෙන් හඳුන්වා උදාහරණ 2ක් සපයන්න.
    (iv) අන්තර් පුද්ගල සන්නිවේදනයේ ලක්ෂණ 4ක් හඳුන්වන්න.

04. (i) ''සන්නිවේදනය'' මඟින් ඉටු කෙරෙන මූලිකම කාර්යයන් 4 නම් කරන්න.
    (ii) ''ආකේතකරණය'' යන්න හඳුන්වන්න.
    (iii) රූපවාහිනියේ ප්‍රචාරයවන ප්‍රචණ්ඩ ක්‍රියා සහිත වැඩ සටහන් නිරන්තරයෙන් නැරඹීමෙන් දරුවන් තුළ සිදුවන ප්‍රධාන වෙනස්කම් 3ක් පිළිබඳව පෙන්සිල්වේනියානු විශ්ව විද්‍යාලය දක්වා තිබේ. එම වෙනස්කම් දක්වා විස්තර කරන්න.
    (iv) සන්නිවේදනයේදී ''විනෝදාස්වාදය'' සම්පාදනයේ වැදගත්කම දැක්වීමට කරුණු 4ක් ඉදිරිපත් කර විස්තර කරන්න.

05. (i) සන්නිවේදන අධ්‍යයනය ශාස්ත්‍රීය විෂය ක්ෂේත්‍රයක් ලෙස ආයතනගත කිරීමට මුලින්ම පියවර ගනු ලැබුවේ කවුරුන් විසින්ද යන්න දක්වා එම ආයතන නම් කරන්න.

(ii) සන්නිවේදන අධ්‍යයනය ස්වාධීන ශාස්ත්‍රීය විෂයක් ලෙස ශාස්ත්‍රීය සංවර්ධනයට අවශ්‍ය පදනම සකස් කළ විද්වතුන් 6 දෙනෙකු නම් කරන්න.

(iii) සන්නිවේදනය අද මුළු ලෝකයම එකම පවුලක් බවට පත්කර ඇත්තේ කුමන ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙසද? සවිස්තරාත්මකව දක්වන්න.

(iv) සන්නිවේදනය දෛනික ජීවිතය සමඟ ප්‍රබලවම සම්බන්ධ වූවක් ලෙස දක්වන්නේ කෙසේද? කරුණු හතරක් මඟින් පැහැදිලි කරන්න.

06. (i) ජන සන්නිවේදනයට විශේෂිත වූ අරමුණු නොහොත් කාර්යයන් නම් කරන්න.

(ii) වර්තමානයේ භාවිතවන තාක්ෂණික සන්නිවේදන මෙවලම් 6ක් දක්වන්න.

(iii) ජනමාධ්‍ය ආගමනයෙන් සිදුවූ වාසි 3ක් විස්තර කරන්න.

(iv) මිනිසා භාෂාව නිර්මාණය කර ගැනීම නිසා අත්පත් කරගත් කුසලතා 4ක් සඳහන් කර විස්තර කරන්න.

07. (i) වර්තමානයේ ශ්‍රී ලංකාවේ සන්නිවේදනය පිළිබඳ පාඨමාලා පැවැත්වෙන විශ්ව විද්‍යාල නම් කරන්න.

(ii) සියලුම සන්නිවේදන අවස්ථාවලදී ක්‍රියාවලියක් (ක්‍රියාපටිපාටියක්) සිදුවේ මෙය උදාහරණයක් සමඟ පැහැදිලි කරන්න.

(iii) විශ්ව විද්‍යාල අයදුම්පත් අයදුම්කරුවන් විසින් අන්තර්ජාලය හරහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේඛකාධිකාරී වෙත යවනු ලබයි.

අ) මෙහි සන්නිවේදකයා, මාධ්‍ය, ග්‍රාහකයා සහ පණිවිඩය නිවැරදි ලෙස දක්වන්න.

ආ) අයදුම්පත ලැබුණු බවට අයදුම්කරුවන්ට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ආපසු පණිවිඩයක් ලබාදීමට භාවිතා කළ හැකි මාධ්‍ය 4ක් නම් කරන්න.

(iv) යහපත් සන්නිවේදකයෙකු මෙන්ම පුරවැසියෙකු ලෙස විචාරශීලීව මාධ්‍ය පරිහරණය කිරීමේ ශික්ෂණයෙහි වැදගත්කම දැක්වෙන කෙටි රචනයක් ලියන්න.

## පළමු වාර පරීක්ෂණය - 2019 - 12 ශ්‍රේණිය

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## I කොටස

### පිළිතුරු පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| **01.** - 3 | **11.** - 2 | **21.** - 2 | **31.** - 1 | **41.** - 5 |
| **02.** - 4 | **12.** - 5 | **22.** - 4 | **32.** - 4 | **42.** - 3 |
| **03.** - 3 | **13.** - 3 | **23.** - 4 | **33.** - 3 | **43.** - 5 |
| **04.** - 2 | **14.** - 5 | **24.** - 1 | **34.** - 1 | **44.** - 3 |
| **05.** - 4 | **15.** - 4 | **25.** - 3 | **35.** - 2 | **45.** - 3 |
| **06.** - 1 | **16.** - 5 | **26.** - 3 | **36.** - 4 | **46.** - 4 |
| **07.** - 3 | **17.** - 1 | **27.** - 1 | **37.** - 4 | **47.** - 5 |
| **08.** - 2 | **18.** - 4 | **28.** - 3 | **38.** - 5 | **48.** - 4 |
| **09.** - 2 | **19.** - 5 | **29.** - 2 | **39.** - 4 | **49.** - 1 |
| **10.** - 1 | **20.** - 3 | **30.** - 2 | **40.** - 1 | **50.** - 5 |

## II කොටස - පිළිතුරු

01. (i) මනෝවිද්‍යාව, සමාජ විද්‍යාව, දේශපාලන විද්‍යාව (ල. 2)

(ii) * සන්නිවේදන තාක්‍ෂණයේ දියුණුව , ජනමාධ්‍යයේ වර්ධනය , මාධ්‍ය මඟින් සමාජයට එල්ල කළ බලපෑමේ ස්වභාවය (නම් කිරීම ල : 2 / විස්තර කිරීම ල : 2) (එකතුව ල : 4)

(iii) රූපවාහිනිය නිසා ළමයින්ගේ සමාජ සම්බන්ධතා දුරස්වන බව, තම වේදනාවන් දුරස් කර ගැනීමට භාවිතා කරන බව.
දෙමව්පියන් සමඟ අඩ දබර ඇති කරගන්නා දරුවන් නොරිස්සුම් හැඟීම්වලින් පලා යාමට රූපවාහිනිය භාවිත කරන බව (ල.3 විස්තර කිරීමට ල. 3 (3+3-6))

(iv) සන්නිවේදනය
තොරතුරු හුවමාරුව සන්නිවේදනය යි. , සජීවී මෙන්ම සක්‍රීය විෂය ක්ෂේත්‍රයකි, මානව අන්තර් සබඳතා පැවැත්වීමේ අත්‍යවශ්‍ය සහ ප්‍රමුඛතම මෙවලමකි. 4. සන්නිවේදනය පිළිබඳ නිර්වචන, සන්නිවේදනයේ පදනම කාර්යභාරය, සන්නිවේදන වර්ග, ආකෘති, න්‍යායාත්මක කරුණු, ප්‍රායෝගික භාවිත කුසලතා පිළිබඳ, අවධානය යොමු කිරීම යනාදිය මෙම විෂය කොටසට අයත් වේ. දෙකක් විස්තර කරන්න.
මාධ්‍ය අධ්‍යයනය
විචාරශීලීත්වයෙන් යුතුව මාධ්‍ය පරිහරණය කිරීමට අවශ්‍ය අවබෝධය සහ ශික්‍ෂණය මාධ්‍ය අධ්‍යයනය මඟින් ලබා දෙයි. මෙයින් මාධ්‍ය සාක්‍ෂරතාව වර්ධනය කර ගත හැක, මාධ්‍ය පිළිබඳ ඉගෙනීම හැඳෑරීම මාධ්‍ය අන්තර්ගතය, මාධ්‍ය ක්‍රියාකාරීත්වය හැඳින්වීම. මාධ්‍ය පුද්ගලයාට, සමාජයට සංස්කෘතියට බලපාන ආකාරය හැදෑරීම මෙයින් සිදුවේ(ල.18)

02. (i) * "තොරතුරු ගැබ්වූ සංඥාවක් කරණකොටගෙන දෙපාර්ශවයක් අතර එක හා සමාන චිත්ත ස්වභාවයක් ඇතිවීම සන්නිවේදනය'' යි. (ල. 2)

(ii) සන්නිවේදන අරමුණු සහගතවීම.
සංකේතාත්මක වීම, ක්‍රියාපටිපාටියක් වීම, විවිධාකාර වීම , ඒක මාර්ගික හෝ ද්විමාර්ගික වීම යනාදී වශයෙන් ( 2ට ල.2 පැහැදිලි කිරීමට ල.2 = 4)

(iii) මාධ්‍ය අධ්‍යාපනය ක්‍ෂේත්‍ර ගණනාවක් පිළිබඳවත් සියලුම මාධ්‍ය කෙරෙහිත් අවධානය යොමු කරන පුළුල් විෂය ක්‍ෂේත්‍රයක් වීම.
චලන රූප, හඬ මාධ්‍ය, මුද්‍රිත මාධ්‍ය, අංකිත තාක්‍ෂණිකමාධ්‍ය යනාදී සියලුම මාධ්‍ය පිළිබඳව ඉගෙනීම, හැදෑරීම, මාධ්‍ය ස්වභාවය අන්තර්ගතය, ඓතිහාසික පරිණාමය, ක්‍රියාකාරකම්, බලපෑම් යනාදී සියල්ල හැදෑරීම මීට අයත් වීම.
පුද්ගලයා මාධ්‍ය සාක්‍ෂරතාවයෙන් සමන්විත කිරීම. (ල.3 , පැහැදිලි කිරීමට ල. 3 (3+3=6))

(iv) තොරතුරු සම්පාදනය, විනෝදාස්වාදය, උපදෙස් සම්පාදනය , පෙළඹවීම (ල. 2)
විස්තර කිරීමට ( $1\frac{1}{2}$ x 4 = 6 (2+6 = 8))

03. (i) අප ඕනෑම අවස්ථාවක තොරතුරක් ලබා දීම හෝ ලබා ගැනීම, වින්දනයක් ලබා ගැනීම, ගැටළුවක් විසඳා ගැනීම කුතුහලය සමනය කර ගැනීම වැනි කුමන හෝ අරමුණකින්ය සන්නිවේදනයේ යෙදෙන්නේ. (ල. 2)

(ii) 1.සන්නිවේදන කුසලතා වර්ධනය සඳහා 2. මාධ්‍ය සාක්ෂරතාව සඳහා 3.නිර්මාණශීලී සන්නිවේදන කුසලතා අත්පත්කර ගැනීම සඳහා 4. විචාරශීලීව මාධ්‍ය පරිහරණය කිරීමට හැකිවීම සඳහා 5. අවස්ථාවෝචිත භාෂාව භාවිතා කිරීමේ හැකියාව 6. මාධ්‍ය හා සංස්කෘතිය පිළිබඳ අවබෝධය ලැබීමට 7. මාධ්‍යයේ පුද්ගල හා සමාජ බලපෑම අවබෝධ කර ගැනීම සඳහා... (ල. 4)

(iii) සන්නිවේදකයාගේ සිට ග්‍රාහකයා දක්වා පණිවිඩය ගමන් කිරීම අවහිර වන ලෙස මැදිහත් වන ඕනෑම තත්ත්වයක් හෝ ඝෝෂාවක් සන්නිවේදන බාධක වේ.
1. මාධ්‍ය බාධක 2. අර්ථ බාධක, මේවා හඳුන්වා උදාහරණ 02 ක් සපයන්න. (ල. 4) (2+4 = 6)

(iv) 1. පුද්ගලයන් දෙදෙනෙකු අතර සිදුවෙයි 2. මුහුණට මුහුණලා හෝ තාක්ෂණය භාවිතයෙන් දුරක සිටින දෙදෙනෙකු අතර හෝ සිදුකළ හැක.
3. ද්විමාර්ගික සන්නිවේදනයකි. (බොහෝවිට), 4. සන්නිවේදක - ග්‍රාහක භූමිකා හුවමාරුවේ - (ප්‍රතිපෝෂණය)
5. විවිධ අරමුණු මේ තුළින් ඉටුකර ගත හැක. (ල. 2 + 6 = 8)

04. (i) * 1.තොරතුරු සම්පාදනය 2. අධ්‍යාපනය 3. පෙළඹවීම 4. විනෝදාස්වාදය සම්පාදනය (ල. 2)

(ii) සිතේ ඇතිවන අදහස් හා හැඟීම් සන්නිවේදනය කිරීමට සංඥා, සංකේත සන්දේශ බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය. (ල. 4)

(iii) 1. වේදනාත්මක දේ පිළිබඳ දරුවන්ගේ සංවේදීතාව අඩුවීම, 2. දරුවන් ඔවුන් ජීවත් වන පරිසරය හා අවට ලෝකය පිළිබඳව බියක් ඇති කර ගැනීම ,3. අන් අය සමඟ ආක්‍රමණශීලී වීමටත් ආරවුල් ඇති කර ගැනීමටත් වැඩි නැඹුරුවක් ඇති වීම. (ල. 3 , විස්තර කිරීමට ල.3 (ල. 6))

(iv) 1. ඕනෑම සන්නිවේදන කාර්යයක් සමඟ විනෝදාස්වාදය මුසු වූ විට ආකර්ෂණීය අවස්ථාවක් ජනිත වීම
2. දේශනයකදී, ලේඛනයක දී ඉගෙනුම් දී මේ කුමන සන්නිවේදන අවස්ථාවක දී වුව ද විනෝදාස්වාදය භාවිත කිරීම කුසලතාවයක් වෙයි.
3. ආතතියෙන් පෙළෙන වර්තමාන සමාජයට විනෝදාස්වාදය කිසියම් ඉහිල්වීමක් සිදුකරයි.
4. විනෝදාස්වාදය මුසුවූ ආධ්‍යාපනික කාර්යයන් නිසා ඉතා සැහැල්ලුවෙන් තේරුම් ගැනීම සඳහා මතක තබා ගැනීමට හැකි වෙයි. විස්තර කරන්න. (ල. 8)

05. (i) මහාචාර්ය විල්බර්ශ්‍රාම් (ල.1)
ජනමාධ්‍ය පාසල්, සන්නිවේදන පර්යේෂණ ආයතන, විශ්ව විද්‍යාලවල නව අධ්‍යායන අංශ (ල. 1)

(ii) හැරල්ඩ් ඩී. ලැස්වෙල්, කර්ට් ලෙවින්, පෝල් ලැසාෆෙල්ඩ්, කාල් හවුලන්ඩ්, විල්බර් ශ්‍රාම්, ජෝර්ජ් ගාබ්නර්, ක්ලෝඩ් ෂැනොන්, වොරන් වීවර් (ල. 4)

(iii) සන්නිවේදන මාධ්‍යයේ තාක්ෂණික සංවර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස සවිස්තරාත්මකව විස්තර කර තිබිය යුතුය. (ල. 6)

(iv) 1. පංචේන්ද්‍රියයන් ඔස්සේ සන්නිවේදනය සිදුවීම, නිරන්තරයෙන්ම පසිඳුරන්ට ආවේදනයන් ලැබීම (දැනීම ස්පර්ශය, ආඝ්‍රාණය යනාදී වශයෙන්)
2. දැනීම, කතා කිරීම, ලිවීම, විනෝදවීම, යනාදී සෑම ක්‍රියාවලියක්ම සන්නිවේදනය සමඟ ඍජුව හෝ වක්‍රව සම්බන්ධ වී තිබීම.
3. පුද්ගලයා හා සමාජ සබඳතාවන්ගේ පදනම සන්නිවේදනය වීම.
4. පුද්ගල හා සමාජ ගැටළු නිරාකරණයට යහපත් සන්නිවේදනය හේතු වීම.
5. වෙනත් නිවැරදි පිළිතුරුවලට ද ලකුණු දෙන්න. කරුණු වලට ල. 4, විස්තර සඳහා 4 = 8)

06. (i) සුපරීක්ෂණය , අර්ථකථනය , සහසම්බන්ධය , සමාජානුයෝජනය (ල. 2)

(ii) තැපැල් ලිපි, ෆැක්ස්, දුරකථන (ජංගම හා ස්ථාවර) , විද්‍යුත් තැපැල, අන්තර්ජාල දුරකථන, සමාජ ජාල, ස්කයිප් , කෙටි පණිවිඩ (ල. 4)

(iii) 1. තොරතුරු රාශියක් විශාල පිරිසක් වෙත, එකවර කඩිනමින් බෙදා හැරීමේ හැකියාව ලැබීම.
2. හුදකලාව / තනිකම මඟ හැරීම
3. දැනුම , විනෝදය, අධ්‍යාපනය යනාදියෙන් සන්නද්ධ වීමේ අවස්ථා ලැබීම වෙනත් නිවැරදි කරුණු වලට ද ලකුණු දෙන්න. (ල. 6)

(iv) 1. වඩාත් සංකීර්ණ අදහස් හා සංකල්ප වටහා ගැනීමේ හැකියාව ලැබීම.
2 ප්‍රශස්ත ලෙස සහ පහසු ලෙස තොරතුරු හුවමාරු කර ගත හැකි වීම.
3 භාෂා සම්භවය සමඟ අදහස් හා සංකල්ප පිළිබඳ දැනුම පුළුල් වීම.
4. ලේඛනය ආරම්භ වීම - සියලු ජනමාධ්‍ය සහ නව මාධ්‍ය සඳහා මූලාරම්භය වීම විස්තර කරන්න.
(ල. 8)
(එකතුව = 20)

07. (i) කැළණිය වි.වි., ශ්‍රී ජයවර්ධනපුර වි.වි., කොළඹ වි.වි., කොළඹ විශ්ව විද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපය, රජරට විශ්ව විද්‍යාලය, විවෘත විශ්ව විද්‍යාලය, නැගෙනහිර විශ්ව විද්‍යාලයේ ත්‍රිකුණාමල මණ්ඩපය සහ යාපනය විශ්ව විද්‍යාලය (ල. 2)

(ii) සන්නිවේදනය හුදකලා කාර්යයක් නොවේ. නිරන්තරයෙන් කාලයත් සමඟ වෙනස්වෙමින් සාධක කිහිපයක් සමඟ එය බැඳී පවතියි. ඕනෑම අවස්ථාවක දී එය පියවර ගණනාවක් පසු කරයි. උදාහරණ පුද්ගලයෙකු සභාවක් ඉදිරියේ කථාවක් පවත්වන්නේ නම් කථාව සඳහා මූලිකව සිතීම, කරුණු රැස් කිරීම, ගොනු කිරීම, සැළසුම් කිරීම, ඉදිරිපත් කිරීමේ විලාශය තෝරා ගැනීම, පෙරහුරුව, නිවැරදි කිරීම, කථාව ඉදිරිපත් කිරීම, ප්‍රතිචාර බලාපොරොත්තු වීම යනාදී ලෙස අවසන් ප්‍රතිඵලය සඳහා අනුරූප ක්‍රියාවලියක් සිදුවේ. උදාහරණ සහිතව පැහැදිලි කිරීමට (ල. 4)

(iii) අ. සන්නිවේදකයා - අයදුම්කරුවන් - මාධ්‍ය - අන්තර්ජාලය - පණිවිඩය - අයදුම්පත් - ග්‍රාහකයා - ලේඛකාධිකාරී (ල. 3)

ආ. ලියුමක් - තැපැල්පතක් - ඊ-මේල් , දුරකථන ඇමතුම් කෙටි පණිවිඩ, සමාජ ජාල යනාදී ගැළපෙන පිළිතුරු ල.3 (3+3 = 6)

(iv) * රචනය සඳහා අදාළ කරුණු 4 ක්වත් යොදාගෙන තිබිය යුතුය. (ල. 8) (එකතුව = 20)